# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1795/35 - 2013 ජනවාරි 31 වැනි බ්‍රහස්පතින්දා - 2013.01.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**මෝටර් වාහන පනත (203 වන අධිකාරය වූ)**

එල්. ඩී. බී. 24/51 (III).

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

කුමාර වෙල්ගම,
ප්‍රවාහන අමාත්‍ය.

2013 ජනවාරි මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

(1) 1983 ජුනි මස 03 වැනි දින අංක 248 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 1983 මෝටර් වාහන (වාහන තැනීමේ) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. :-

(අ) එහි 57 වන නියෝගය 58 වන නියෝගය ලෙස නැවත අංක යෙදීමෙන් ;
(ආ) එහි 56 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන නියෝගය එකතු කිරීමෙන්.

"57. පහත ලැයිස්තුගත කරන ලද වාහනයේ බොඩිය පහත දැක්වෙන පරිදි වර්ණ ගැල්විය යුතු ය.

(1) යම් ගාස්තුවක් සඳහා හෝ ප්‍රතිලාභයක් සඳහා මගීන් ප්‍රවාහනය කිරීමට භාවිතා කරනු ලබන පොදු මගී ප්‍රවාහන වාහනවල .-

(අ) පැන්ටන් (Pantone) වර්ණ කේත අංක 2707 C යොදා ගනිමින් ලා නිල් වර්ණය ගැල්විය යුතුය ; සහ
(ආ) බොඩියේ දකුණු පස සහ වම් පස පිටුපස කෙළවරේ අකුරුවල ප්‍රමාණය 60 x මි. මී. 35 වන ලෙස වාහනයේ බොඩියේ පහළ කෙළවරේ සිට මි. මී. 500 ඉහළින් සහ බොඩියේ පිටුපස කෙළවරේ සිට මි. මී. 1000 දුරින් අවසන් වන ආකාරයට අයිතිකරුගේ නම සහ ලිපිනය ප්‍රදර්ශනය කළ යුතු වේ.

(2) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් මෙහෙයවන සහ නඩත්තු කරන බස්රථවල පැන්ටන් (Pantone) වර්ණ කේත අංක 185 C

යොදා ගනිමින් රතු වර්ණය ගැල්විය යුතු ය.

(3) ගාස්තුවක් හෝ ප්‍රතිලාභයක් සඳහා පාසල් ප්‍රවාහන කටයුතු සඳහා භාවිතා කරන වාහනවල පැන්ටන් (Pantone) වර්ණ කේත අංක 1375 C යොදා ගනිමින් කහ වර්ණය ගැල්විය යුතු ය".

2. මෙම නියෝග ලියාපදිංචි නොකළ වාහන සම්බන්ධයෙන් 2013 පෙබරවාරි මස වැනි 01 වන දින සිට සහ ලියාපදිංචි වාහන සම්බන්ධයෙන් 2014 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

02-460

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.